# මීගමුව අධ්‍යාපනය කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## පුරවැසි අධ්‍යාපනය

**විභාග අංකය / නම** ..................................................................................................................................................

| 11 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 03 |
| --- | --- | --- |

## I පත්‍රය

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
- (i) දේශපාලන පක්ෂ මාරුවෙන් මාරුවට රට පාලනය කිරීම.
- (ii) ජනතා කණ්ඩායම් වල අදහස් අනුව තීරණ ගැනීම.
- (iii) මහජනතාවට පාලනයට සහභාගී වීමට අයිතියක් තිබීම.
- (iv) අධ්‍යාපනයට හා සමාජ සුභසාධනය ප්‍රමුඛත්වය ලැබීම.

(2) ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක අතරින් කුඩාම භූමි ප්‍රමාණයක් හිමි දිස්ත්‍රික්කය වන්නේ,
- (i) කොළඹ (ii) මාතර (iii) මොණරාගල (iv) වන්නිය

(3) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කර ගැනීම කෙරෙහි බලපෑ ආසන්නතම හේතුව වූයේ,
- (i) ප්‍රංශ විප්ලවය
- (ii) රුසියන් විප්ලවය
- (iii) පළමු ලෝක යුද්ධය
- (iv) දෙවන ලෝක යුද්ධය

(4) අධිකරණ සේවා කොමිසමේ සභාපති ධුරය හිමි වන්නේ,
- (i) නීතිපති වරයාට ය. (ii) ජනාධිපතිවරයාට ය.
- (iii) අග්‍ර විනිශ්චයකාරවරයාට ය. (iv) අධිකරණ ඇමතිවරයාට ය

(5) ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ
- (i) 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි (ii) 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි
- (iii) 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි (iv) 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි

(6) අභියාචනාධිකරණය සතු බලතල පළාත් මට්ටමින් විමධ්‍යගත කිරීමේ අරමුණින් පිහිටවනු ලැබූ අධිකරණය වන්නේ,
- (i) පළාත්බද මහාධිකරණය යි. (ii) මහේස්ත්‍රාත් අධිකරණය යි.
- (iii) දිසා අධිකරණය යි. (iv) මහාධිකරණය යි.

(7) රටක පාලනය නීතියේ උත්තරීතරභාවය අනුව සිදු කිරීම හඳුන්වන්නේ,
- (i) නීතියේ ආධිපත්‍යය යනුවෙනි (ii) ස්වාධිපත්‍ය යනුවෙනි.
- (iii) ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි. (iv) අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙනි.

(8) බහු සංස්කෘතිය සමාජයක යහපැවැත්මට බාධාකාරී වන ලක්ෂණයක් වන්නේ,
- (i) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම යි.
- (ii) අන්‍ය ජාතීන්ගේ භාෂා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යි.
- (iii) ජාති, ආගම් භේද නොසලකා කටයුතු කිරීම යි.
- (iv) අන්‍ය සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය උසස් බව සලකා කටයුතු කිරීම යි.

(9) පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායකයන් පෞද්ගලීකරණය කිරීම සිදුකරනු ලබන්නේ,
- (i) ධනවාදී ආර්ථික්‍රම වල ය. (ii) මිශ්‍ර ආර්ථික්‍රම වල ය.
- (iii) සමාජවාදී ආර්ථික්‍රම වල ය. (iv) පරිවර්තක ආර්ථික්‍රම වල ය.

(10) පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) ආහාර ද්‍රව්‍ය, ඖෂධ (ii) ගොඩනැගිලි, සිමෙන්ති

(iii) යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ (iv) ඇඳුම් පැළඳුම්, පොහොර

(11) පළාත් සභා ක්‍රමය යටතේ මධ්‍යම රජය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,

(i) පළාත් ආණ්ඩුකාරවරයා ය. (ii) පළාත් ප්‍රධාන ලේකම්වරයා ය.

(iii) මහ ඇමතිවරයා ය. (iv) පළාත් සභා සභාපතිවරයා ය.

(12) දේපළ අයිතිය පෞද්ගලික අංශය සතුවීම හා ලාභය පෙරදැරි කරගෙන ආර්ථික කටයුතු සිදුකරන අර්ථ ක්‍රමය,

(i) වෙළඳපොළ අර්ථ ක්‍රමය යි. (ii) ධනවාදි අර්ථක්‍රමය යි.

(iii) මිශ්‍ර අර්ථක්‍රමය යි. (iv) සමාජවාදී අර්ථක්‍රමය යි.

(13) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදුව ඇති අහිතකර බලපෑමක් වන්නේ,

(i) විවිධ කලාපීය සංවිධාන හා එකතු වීමට හැකිවීම යි.

(ii) අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත් වීම යි.

(iii) විදේශ ආයෝජක හා තාක්ෂණය කලා ඒම යි.

(iv) බුද්ධිගලනය වේගවත් වීම යි.

(14) බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරෙන් ප්‍රථමවරට ලාංකිකයන්ට දේශපාලන මැදිහත්විමකට වැඩි අවස්ථාවක් උදාවූයේ,

(i) 1921 මැනිං (iii) 1833 කෝල්බෲක්

(ii) 1931 ඩොනමෝර් (iv) 1910 කෲව් මැකලම්

(15) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

(i) ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි.

(ii) ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයායි.

(iii) අගමැතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය යි.

(iv) ජනාධිපතිවරයා හා ආණ්ඩුකාරවරයා යි.

(16) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහළම අධිකරණය කුමක්ද?

(i) මහාධිකරණය (iii) අභියාචනාධිකරණය

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය (iv) දිසා අධිකරණය

(17) ද්වි පක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් නිවැරදිව දක්වා ඇති පිළිතුර,

(i) ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය

(ii) ඉන්දියාව හා ශ්‍රී ලංකාව

(iii) උතුරු කොරියාව හා චීනය

(iv) බ්‍රිතාන්‍යය හා ප්‍රංශය

(18) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පාර්ලිමේන්තු පනතක් මඟින් පැවරීම.

(i) බලය බෙදාහැරීම ලෙස සැලකේ. (ii) බලය පවරාදීම ලෙස සැලකේ.

(iii) බලය විමධ්‍යගත කිරීම ලෙස සැලකේ. (iv) බලය මධ්‍යගත කිරීම ලෙස සැලකේ.

(19) සමාජයක පවතින දැනුම, ඇදහිලි, කලා, නීතිරීති, සිරිත් විරිත් යන අංගයන් සියල්ලේ එකතුව හඳුන්වනු ලබන්නේ,

(i) සමාජය ලෙසයි (ii) සංස්කෘතිය ලෙසයි

(iii) සම්ප්‍රදාය ලෙසයි (iv) පරම්පරාව ලෙසයි

(20) සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර ඇතිවන වෘත්තීය ගැටලු විසඳා ගැනීමට යොදාගත හැකි සුදුසුම ක්‍රමවේදය වන්නේ,

(i) සමථකරණයයි (ii) උපදේශනයයි

(iii) සහමන්ත්‍රණයයි (iv) මැදිහත්කරණයයි

(21) ශ්‍රී ලංකාව තුළ ආගමක් පදනම් කරගෙන සකස් වී ඇති නීතිය කුමක්ද?

(i) උඩරට නීතිය (ii) මුස්ලිම් නීතිය

(iii) තේසවලාමෙයි නීතිය (iv) රෝම ලන්දේසි නීතිය

(22) රටක් තුළ ජීවත්වන විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් එක් ජාතියක් ලෙස සැලකෙන රාජ්‍ය සංකල්පය වන්නේ,

(i) ජාතික රාජ්‍යය යි (ii) සංඝීය රාජ්‍යය යි

(iii) ඒකීය රාජ්‍යය යි (iv) බහුවිධ රාජ්‍යය යි

(23) රුසියාව හා යුක්රේනය අතර නිර්මාණය වී ඇත්තේ,

(i) දේශපාලන ගැටුමකි (ii) ආගමික ගැටුමකි

(iii) වාර්ගික ගැටුමකි (iv) ආර්ථික ගැටුමකි

(24) සන්ධීය ආණ්ඩුක්‍රමයක් පවතින රටක් වන්නේ,

(i) මහා බ්‍රිතාන්‍යය යි (ii) ජර්මනිය යි

(iii) ශ්‍රී ලංකාව යි (iv) ස්විට්සර්ලන්තය යි

(25) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මානව හිමිකම් හඳුන්වන සංකල්පය කුමක්ද?

(i) සමාජ අයිතිවාසිකම් (ii) මානව අයිතිවාසිකම්

(iii) ජනතා අයිතිවාසිකම් (iv) මූලික අයිතිවාසිකම්

(26) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය සාධකයක් වන්නේ,

(i) නීතියේ ආධිපත්‍ය පැවතීමයි

(ii) විදේශ සබඳතා තරකර ගැනීමයි

(iii) දිළිඳුකම තුරන් කිරීමයි.

(iv) ජනතා ගැටලු ඉදිරිපත් කිරීමට හැකිවීමයි.

(27) වර්තමාන ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය සඳහා බලපා ඇති වැදගත්ම හේතුව කුමක්ද?

(i) රටවල භූගෝලීය පිහිටීමයි. (ii) බටහිර රටවලට යටත් වීමයි.

(iii) විශ්ව ගම්මානයක් බවට පත්වීමයි. (iv) වෙළඳ සබඳතා පුළුල් වීමයි.

(28) ඇමරිකා එක්සත් ජනපදයේ සෙනට් සභාවට නියෝජිතයන් පත්කරනු ලබන්නේ,

(i) ජනාධිපතිවරයා විසිනි (ii) ප්‍රාන්ත ආණ්ඩු විසිනි

(iii) ෆෙඩරල් අධිකරණය විසිනි (iv) කොංග්‍රස් මණ්ඩලය විසිනි

(29) ජාතික රාජ්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,

(i) පාර්ලිමේන්තුවයි (ii) ආණ්ඩුවයි

(iii) විධායකයයි (iv) අධිකරණයයි

(30) අයිතිවාසිකම් හා බැඳුණු සදාචාරාත්මක යුතුකම් සඳහන් වන පිළිතුර තෝරන්න.

(i) පොදු දේපළ ආරක්ෂා කිරීම (ii) පරිසරය ආරක්ෂා කිරීම

(iii) රජය විසින් පනවන බදු ගෙවීම (iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම

(31) බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,

(i) බලතල ඕනෑම අවස්ථාවක ආපසු පවරාගත හැකි වීමයි.

(ii) විවිධත්වය තුළ එක්සත් බවක් ගොඩනගා ගැනීමයි

(iii) සියලුම තීරණ මධ්‍යම ආණ්ඩුව විසින් ගනු ලැබීමයි.

(iv) ලිඛිත ආණ්ඩුවක්‍රම ව්‍යවස්ථාවක් තිබීමයි.

(32) රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ,

(i) රාජ්‍ය සේවය දේශපාලනීකරණය නොවීම (ii) රාජ්‍ය පාලනය කාර්යක්ෂම වීම

(iii) අල්ලස හා දූෂණය ඉහල යාම (iv) ආර්ථික හා මානව සම්පත් හිඟවීම

(33) රාජ්‍ය වල ප්‍රධාන ස්වරූප දෙක කුමක්ද?

(i) ජනාධිපති හා පාර්ලිමේන්තු රාජ්‍යය (ii) ඒකීය හා සන්ධීය රාජ්‍යය

(iii) ජාතික හා ප්‍රාදේශීය රාජ්‍යය (iv) ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය

(34) මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් හැඳින්වෙන නම කුමක්ද?

(i) වුවමනා (ii) නිෂ්පාදන

(iii) අවශ්‍යතා (iv) භාණ්ඩ හා සේවා

(35) ගැටුම් අවම කර ගැනිම සඳහා පුරවැසියෙකු තුළ වර්ධනය කරගත යුතු සමාජ ගුණාංග වන්නේ,

(i) ජීවිත හානි වැළැක්වීමයි (ii) මානසික ආතතිය අවම වීමයි

(iii) අන්තම ගරු කිරීමයි (iv) නිර්මාණාත්මක චින්තනය වර්ධනයයි

(36) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය කුමක්ද?

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි (ii) අපරාධ නීතියයි

(iii) උඩරට නීතියයි (iv) රෝම ලන්දේසි නීතියයි

(37) ළමයාගේ උපරිම යහපත සැලසීමට රාජ්‍යයන් විසින් ඉටුකල යුතු වගකීමක් වන්නේ,

(i) ළමා අපයෝජකයන්ගෙන් ආරක්ෂා කිරීමයි

(ii) මත්ද්‍රව්‍ය භාවිතයෙන් ආරක්ෂා කිරීමයි

(iii) ළමා ශ්‍රමික භාවයෙන් ආරක්ෂා කිරීමයි

(iv) සමාජ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමයි

(38) ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යයට අයත් අංශ මොනවාද?

(i) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය

(ii) පාලන බලතල, මානව අයිතිවාසිකම් හා ඡන්ද බලය

(iii) පාලන බලතල, වැඩිහිටි අයිතිවාසිකම් හා ඡන්ද බලය

(iv) පාලන බලතල, කාන්තා අයිතිවාසිකම් හා ඡන්ද බලය

(39) ''අ'' තීරුවේ රාජ්‍යයක දැකිය හැකි අංග හා ''ආ'' තීරුවන් එම අංග වලින් ඉටුවන කාර්යයන් දක්වා ඇත. ''අ'' තීරුව හා ''ආ'' තීරුව නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. ව්‍යවස්ථාදායකය | A. නීති ක්‍රියාත්මක කිරීම. |
| 2. විධායකය | B. පාලන කටයුතු මෙහෙයවීම. |
| 3. අධිකරණය | C. නීති පැනවීම. |
| 4. ආණ්ඩු පක්ෂය | D. විකල්ප ආණ්ඩුවක් ලෙස හැසිරීම. |
| 5. විරුද්ධ පක්ෂය | E. යුක්තිය පසිඳලීම. |

(i) A B C D E (ii) A C D B E (iii) B C D A E (iv) C A E B D

(40) ''අ'' තීරුව ''ආ'' තීරුව සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. ශ්‍රේෂ්ඨාධිකරණය | A. මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි |
| 2. අභියාචනාධිකරණය | B. විවාහ සම්බන්ධ නඩු |
| 3. මහාධිකරණය | C. ආදායම් පිළිබඳ නඩු |
| 4. මහේස්ත්‍රාත් අධිකරණය | D. ජනාධිපතිවරණ පෙත්සම් විභාග |
| | E. මිනිමැරුම් සම්බන්ධ නඩු |
| | F. වාණිජ ආරවුල් විසඳම |
| | G. හේබියස් කොපුස් ආඥා නිකුත් කිරීම |

(i) A G B E (ii) B D F G (iii) D G E A (iv) G E F D

## II පත්‍රය

❖ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(1) (i) ලෝකයේ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා අතීතයේ සිට භාවිතා කර ඇති පාලන ක්‍රම දෙකක් ලියන්න.

(ii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(iv) බලය යන සංකල්පයේ විවිධ ස්වරූප හඳුනාගත හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

(v) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධක අතරින් ආක්‍රමණ දෙකක් ලියන්න.

(vi) තිරසාර සංවර්ධනයේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න.

(vii) ගැටුම් නිරාකරණයේ දී බේරුම්කරුවෙකු සතුවිය යුතු ගුණාංග දෙකක් නම් කරන්න.

(viii) මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ දෙකක් සඳහන් කරන්න.

(ix) දේශීය නීතියට අයත් කොටස් දෙකක් නම් කරන්න.

(x) සොල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට එක් වූ අංග දෙකක් නම් කරන්න.

(ල. 2 x 10 = 20)

(2) (i) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු තුනක් ලියන්න. (ල. 3)

(iii) (අ) නූතන රාජ්‍ය තුළින් හඳුනා ගත හැකි පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් ලියන්න. (ල. 2)

(ආ) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 3ක් ලියන්න. (ල. 3)

(3) (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සතු බලතල වර්ගීකරණය කර ඇති ලැයිස්තු දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල තුනක් ලියන්න. (ල. 3)

(iii) අ) මහ නගර සභාවේ සහ නගර සභාවේ ප්‍රධානීන් පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

ආ) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් තුනක් ලියන්න. (ල. 3)

(4) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලිය වැදගත් වේ.

(i) නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජය සංවිධානය වී ඇති අකාරය රටවල් වර්ග කළ හැකි ආකාර තුන නම් කරන්න. (ල. 3)

(iii) නිෂ්පාදන භාණ්ඩ පරිභෝජනය කෙරෙන ආකාර අනුව බෙදිය හැකි කොටස් තුන නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(5) ගැටුම් වර්ග පිළිබඳ අධ්‍යයනය කිරීමේදී එය විවිධ ස්වරූප අනුව හඳුනාගත හැකිය.

(i) ගැටුම් වර්ග ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ අධ්‍යයනය කළ හැකිය. එම ක්ෂේත්‍ර දෙක නම් කරන්න. (ල. 2)

(ii) ගැටුම් ඇතිවීමට බලපාන හේතු තුනක් ලියන්න. (ල. 3)

(iii) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වාසි දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

(6) සමාජයක යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා සෑම පුරවැසියෙකුම නීතිය පිළිබඳ දැන සිටිය යුතුය.

(i) නීතියේ මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග තුනක් සඳහන් කරන්න. (ල. 3)

(iii) අප්‍රමාද ව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසිදායක තත්ත්වයන් දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න (ල. 5)

(7) (i) වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) මහ නගර සභාවලට පැවරී ඇති බලතල තුනක් සඳහන් කරන්න. (ල. 3)

(iii) (අ) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් දක්වා ඇති තේමා තුනෙන් දෙකක් ලියන්න. (ල. 3)

(ආ) පොදු උපයෝගිකා සේවා යටතට ගැනෙන කාර්යයන් දෙකක් ලියන්න. (ල. 2)